**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය - 2022**

**----------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5. මූල්‍ය ප්‍රකාශන

### 1.5.1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලී බඩු සහ සවි කිරීම්, කාර්යාල උපකරණ සහ පරිගණක වැනි රු.696,175 ක් වටිනා සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් තවදුරටත් භාවිතා කරමින් පැවතිය ද ඒවා නැවත තක්සේරු කර ගිණුම්ගත කිරීමට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 අනුව කටයුතු කර නොතිබුණි. | ලී බඩු හා සවි කිරීම්, පරිගණක උපාංග හා කාර්යාල උපකරණ ආදිය භාවිතා කළද ඒවා අගය කර ඵලදායී ජීවිත කාලය තක්සේරු කළ නොහැක. බොහොමයක් වත්කම් ඉවත් කළ යුතු තත්ත්වයේ පවතින අතර පරිගණක වැනි උපකරණ යාවත්කාලීන කළ හැකි තත්ත්වයේ නොපවතියි. මෙම වත්කම් පූර්ණ කාර්යක්ෂමතාවයෙන් භාවිතා කළ නොහැකි තත්ත්වයේ පවතින බැවින් ඉදිරියේදී ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | භාවිතා කරමින් තිබෙන සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් නැවත තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 හි 59 වන ඡේදය ප්‍රකාරව මෙම යෝජනාක්‍රමයේ සක්‍රීය දායකයන් හා ධීවර විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම සඳහා ආයු ගණක තක්සේරුව කාලානුරූපීව සිදු කළ යුතු වුවද 2007 වර්ෂයෙන් පසුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා එම ආයු ගණක තක්සේරුව සිදු කර නොතිබුණු අතර එදිනට සක්‍රීය දායකයන් හා ධීවර විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම රු.5,068,050,746 ක් විය. | ආයුගණක තක්සේරුව 2023 වර්ෂයේ සිදුකිරීමට කටයුතු කරනු ලබන අතර, එය අයවැය ලේඛනය තුළ ඇතුළත්වේ. | විශ්‍රාම වැටුප් වගකීම ආයුගණක තක්සේරුව අනුව කාලානුරූපීව ගණනය කළ යුතුය |

### 1.5.2. ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ධීවර විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කාර්ය මණ්ඩලයක් නොමැතිව තිබියදී මණ්ඩලයේ සභාපතිගේ පෞද්ගලික ලේකම්, තඹුත්තේගම දිස්ත්‍රික් කාර්යාලයේ කාර්යාල සහායක සහ මන්නාරම දිස්ත්‍රික් කාර්යාලයේ කළමනාකරණ සහකාර නිලධාරියෙකු සේවයේ යොදවාගෙන ඒ තිදෙනාට වැටුප් ලෙස එකතුව වු රු.2,209,812 ක් ගෙවා යෝජනාක්‍රමයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මෙම නිලධාරීන් බඳවාගෙන ඇත්තේ මෙම යෝජනාක්‍රමයේ රාජකාරී සඳහා වේ.වර්තමානයේ වෙනත් රාජකාරි කටයුතු කරනු ලබන අතර වෙනත් නිලධාරීන්ද මෙම යෝජනාක්‍රමයේ රාජකාරි සිදු කරයි. මෙම නිලධාරීන්ගේ වැටුප යෝජනාක්‍රමයට ඇතුළත් කර ඇත. ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් බඳවා ගැනීමෙන් පසු යෝජනාක්‍රමයට අදාළ සේවකයින්ගේ වැටුප් යෝජනාක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීමට නියමිතය. | අනුමත නොවූ තනතුරු සඳහා බඳවා ගැනීම සහ වැටුප් ගෙවීම නොකළ යුතුය. |
| (ආ) | 2019 වර්ෂයෙන් ඉදිරියට රැගෙන එන ලද රු.98,000 ක ධීවර මරණ පාරිතෝෂික අරමුදලෙහි ගෙවිය යුතු ශේෂය 2020 වර්ෂයේ නිරවුල් කර ඇතත් එම නිරවුල් කිරීම සදොස් ලෙස ගිණුම්ගත කිරීම නිසා ශේෂය සමාලෝචිත වර්ෂයේදී ද ඉදිරියට රැගෙන විත් තිබුණි. | මෙම මුදල මරණ පාරිතෝෂික අරමුලින් හා ධීවර විශ්‍රාම වැටුප් අරමුදල් තුළින් ගැලපීම් සිදුකොට 2023 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදිව දැක්වීමට කටයුතු කරනු ලැබේ. | සිදුව ඇති වරද වහාම නිවැරදි කළ කළ යුතුය. |

### 1.5.3. අරමුදලේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යෝජනාක්‍රමයේ මුළු වත්කම් රු.663,412,060 ක් සහ මුළු වගකීම් රු.5,140,628,886 ක් පැවති අතර වත්කම් ඉක්මවූ වගකීම් රු.4,477,216,826 ක් විය. මෙම අවාසිදායක තත්ත්වය යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි. | මෙම යෝජනාක්‍රමය ස්වයං මූල්‍ය පදනමකින් ක්‍රියාත්මක නොවන අතර, වාරික තීරණය කිරීමේදී රාජ්‍ය සහනාධාරයට අන්තර්ග්‍රහණය කිරීම නිසා මෙම තත්ත්වය උද්ගත වී ඇත. ඒ අනුව වාර්ෂිකව ගෙවිය යුතු විශ්‍රාම වැටුප් වගකීම ඉහළ යනු ලබන අතර එම නිසා ශුද්ධ වත්කම් අගයද අඩු වේ. එම හේතු නිසා මෙම යෝජනාක්‍රමය සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීම ප්‍රවර්ධනය නොකරයි. | යෝජනාක්‍රමය සක්‍රීය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6. නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත | | | |
| (අ) 5(1) වගන්තිය | වයස අවුරුදු 18 සහ 59 අතර යම් ධීවරයෙකුට මෙම ධීවර විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමයට බැඳීමට හිමිකම් ඇතත් 2018 වර්ෂයෙන් පසු යෝජනාක්‍රමයට ධීවර විශ්‍රාම වැටුප් සාමාජිකයන් බඳවාගෙන නොතිබුණි. | ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය මූල්‍ය ශක්‍යතාවයක් සහිතව ක්‍රියාත්මක කිරීමට කටයුතු සම්පාදනය කර ඇත. ඒ සඳහා පරිගණක දත්ත පද්ධතියක් සකස් කරමින් පවතී. යෝජනාක්‍රමයට ධීවරයින් ආකර්ශණය කරගැනීම සඳහා 2023 වර්ෂය තුළදී ධීවර අමාත්‍යාංශය සමග ඒකාබද්ධව නව යෝජනා ක්‍රමයක් හඳුන්වාදීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. | යෝජනාක්‍රමය සක්‍රීය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 7 වගන්තිය | යෝජනාක්‍රමයට දායක වී සිටින ධීවරයින් සඳහා වයස අවුරුදු 60 සම්පූර්ණ වන විටම විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමේ ක්‍රමවේදයක් නොතිබීම හේතුවෙන්, යෝජනාක්‍රමයට දායකත්වය ලබා සිටින 64,117 ක් වූ ධීවර ප්‍රජාව වෙත ප්‍රතිලාභ ලබා දීමේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය. | | |
| | (i). ප්‍රතිලාභ අයදුම් කළ යුතු බව සහ අයදුම් කළ යුතු ආකාරය දැනුවත් කිරීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබීම. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට යෝජනාක්‍රමයට දායක වයස අවුරුදු 60 ඉක්මවා විශ්‍රාම වයසට පැමිණ සිටි 27,976 ක් වූ ධීවර දායකයින්ගෙන් 22,402 ක් වෙත ධීවර විශ්‍රාම වැටුප් ප්‍රතිලාභය ප්‍රදානය කර නොතිබුණි. එහි ප්‍රතිශතය සමාලෝචිත වර්ෂයේ අවසානයට වයස අවුරුදු 60 සම්පූර්ණ වූ මුළු දායකයින්ගෙන් සියයට 80 ක් විය. | වයස අවුරුදු 60 සම්පූර්ණ වන දායක ලැයිස්තු ඒ ඒ දිස්ත්‍රික් කාර්යාල වෙත යවා ඇති අතර, එම ලැයිස්තු පදනම් කරගෙන විශ්‍රාම වැටුප් හිමි ධීවරයින්ව දැනුවත් කිරීම ආරම්භ කර ඇත. යෝජනාක්‍රමයට අදාළ මෙහෙයුම් කටයුතු සිදුකරන ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත මේ පිළිබඳ දැනුම් දී ඇත. තවද, දිස්ත්‍රික් ධීවර කාර්යාල මගින් සිදුකරන දැනුවත් කිරීම්වලට අමතරව පුවත්පත් දැන්වීමක් මගින් ධීවර ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | ප්‍රතිලාභ හිමිවන ධීවර විශ්‍රාමිකයින් හඳුනා ගැනීම හා දැනුවත් කිරීමට ක්‍රමවේදයක් සකස් කර විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් ලබන දින සිට එය ප්‍රදානය කිරීමට ක්‍රමවේදයන් සකස් කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | (ii). දායකයෙකු වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට ඔහු විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් ලබන නමුත්, යෝජනාක්‍රමය විසින් හිඟ විශ්‍රාම වැටුප් මුදල් නොගෙවා විශ්‍රාම වැටුප් සකස් කළ දින සිට ගෙවීම් කිරීම.<br>මේ හේතුවෙන් 2009 ජනවාරි සිට 2016 දෙසැම්බර් දක්වා කාලයට අදාළව විශ්‍රාම වැටුප් ප්‍රදානය කළ ධීවරයන් 137 ක් සඳහා රු.4,063,063 ක් සහ 2022 වර්ෂයේදී විශ්‍රාම වැටුප් ප්‍රදානය කළ ධීවරයින් 83 ක් සඳහා රු.1,675,851 ක් ලෙස එකතුව රු.5,738,917 ක් හිඟ විශ්‍රාම වැටුප් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනය කර තිබුණු නමුත් ධීවරයන් වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රමාද වී ලැබී ඇති අයදුම්පත් ප්‍රමාදවීමට හේතුවූ කරුණු දන්වනතුරු හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම සිදුනොකරන ලදී. මේ වන විට හිඟ විශ්‍රාම වැටුප් සහිතව විශ්‍රාම වැටුප් ගෙවීම සිදුකරනු ලබයි. | විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් ලබන දින සිට විශ්‍රාම වැටුප් මුදල් ගෙවීම කළ යුතුය. |
| | (iii). ඉල්ලීම් කළ ධීවරයන් වෙත විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ සකස් කර ප්‍රතිලාභ ලබා දීමට වයස අවුරුදු 60 සම්පූර්ණ වී මාස 1 සිට අවුරුදු 07 ක් දක්වා කාලයක් ප්‍රමාද කර තිබුණි. | **පිළිතුරු දී නොමැත** | විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් ලබන දින සිට එය ප්‍රදානය කිරීමට ක්‍රමවේදයන් සකස් කළ යුතුය. |
| (ඇ) 16 වගන්තිය | මෙම යෝජනාක්‍රමයේ දායක මුදල් ගෙවීමේදී අනුගාමී වාරික දහයක් සඳහා වාරික මුදල් නිසිපරිදි නොගෙවීම මත දායකයෙකුට ප්‍රතිලාභ අහිමි වී ඇති අවස්ථාවක ඒ බව දායකයා වෙත දැනුවත් කිරීම් කළ යුතු වුවද එම දැනුවත් කිරීම සිදුකර නොතිබුණි. | | |
| | (i). එම නිසා වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විශ්‍රාම වැටුප් හිමිකම ඉල්ලා පසුගිය වර්ෂයේදී පුද්ගලයින් 42 ක් සහ සමාලෝචිත වර්ෂයේදී පුද්ගලයින් 41 ක් ඉදිරිපත් කළ අයදුම්පත් වාරික මුදල් නිසිපරිදි නොගෙවීම මත ප්‍රතිලාභ අහිමි වී තිබුණි. | විශ්‍රාම වැටුපට දායක කරගැනීමේදී ලබාදෙනු ලබන විශ්‍රාම වැටුප් ඔප්පුවේ පැහැදිලිව සටහන් කර ඇති අතර, දායකයින්ගෙන් වාරික අයකර ගනු ලබන්නේ දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති නිලධාරීන් මගින් වන අතර, එම දායකයා දායකත්වය අවලංගු වූ අයෙක්ද යන වග සොයා බලා වාරික මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් අඛණ්ඩව ඔවුන් වෙත ලබාදීමට මණ්ඩලය විසින් කටයුතු කරනු ලබයි. | අනුගාමී වාරික දහයක් නිසි පරිදි නොගෙවීම මත ප්‍රතිලාභ අහිමිවීම පිළිබඳව දායකයා දැනුවත් කිරීම් කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | (ii). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට වයස අවුරුදු 60 සම්පූර්ණ කර නොතිබුණු වාරික ගෙවමින් යෝජනා ක්‍රමයෙහි දායකත්වය ලබාගත් ධීවරයන් 24,867 ක් සිටි නමුත් විගණිත දිනය වන විට සක්‍රීය ලෙස වාරික ගෙවමින් දායක වී සිටි ධීවරයින් ගණන 120 ක් විය. දිස්ත්‍රික් ධීවර කාර්යාලවල ධීවර පරීක්ෂක, සහකාර අධ්‍යක්ෂ, ලිපිකරු යන නිලධාරීන් වෙත වාරිකයකට රු.11 බැගින් කොමිස් මුදලක් ලබා දී තිබුණද ධීවරයන්ට විශ්‍රාම වැටුප් ප්‍රතිලාභය අහිමිවන හේතු පිළිබඳ එම නිලධාරීන් විසින් ධීවරයින් දැනුවත් කර නොතිබුණි. | විශ්‍රාම වැටුපට දායක කරගැනීමේදී ලබාදෙනු ලබන විශ්‍රාම වැටුප් ඔප්පුවේ පැහැදිලිව සටහන් කර ඇති අතර, දායකයින්ගෙන් වාරික අයකර ගනු ලබන්නේ දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති නිලධාරීන් මගින් වන අතර, එම දායකයා දායකත්වය අවලංගු වූ අයෙක්ද යන වග සොයා බලා වාරික මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් අඛණ්ඩව ඔවුන් වෙත ලබාදීමට මණ්ඩලය විසින් කටයුතු කරනු ලබයි. | අනුගාමී වාරික දහයක් නිසි පරිදි නොගෙවීම මත ප්‍රතිලාභ අහිමිවීම පිළිබඳව දායකයා දැනුවත් කිරීම් කළ යුතුය |
| (ඇ) 20 වගන්තිය | යෝජනාක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ස්ථාපිත උපදේශක කාරක සභාව 2016 නොවැම්බර් මාසයෙන් පසු මේ දක්වා රැස්වී නොතිබුණි. | යෝජනාක්‍රමයේ නව බඳවා ගැනීම් 2023 වර්ෂය තුළදී සිදු කිරීමට නියමිත අතර උපදේශක කාරක සභාව මෙම වර්ෂය තුළ කැඳවීමට කටයුතු කරනු ලැබේ. | පනත ප්‍රකාරව උපදේශක කාරක සභාව රැස්විය යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.406,060,646 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.427,806,225 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.21,745,579 ක ඌනතාවයේ අඩුවීමක් නිරීක්ෂණය විය. මෙම ඌනතාවයේ අඩුවීමට සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම පසුගිය වසරට වඩා රු.67,310,123 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.